චක්‍ර ලේඛ අංකය: 06/2013

මාගේ අංකය: ඩබ්/විවිධ/ /2013.
බන්ධනාගාරමූලස්ථානය,
කොළඹ09.
2013.01.23 වෙනි දින

සියළුම බන්ධනාගාර අධිකාරි වරුන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරිවරු වෙත.

## " වෙලිකඩ කලාපොළ "ආරම්භ කිරීම - 2013

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජධීර අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව " **වෙලිකඩ කලාපොළ** "කොළඹ 09 වෙලිකඩ පාරේ (බන්ධනාගාර සංකීර්ණය ආශ්‍රිතව) ආරම්භ කිරීමට තීරණය කර ඇත.සෑම මසකම අවසන් සෙනසුරාදා මෙකී කලා පොළ මහජනතාවට සහ සංචාරකයින්ට විවෘත කිරීමට අපේක්ෂා කෙරේ.මෙම කලා පොළේ ආරම්භක අවස්ථාව 2013.03.27 දිනට යෙදෙන **ලෝක කලාගාර** දිනයේදී ඉහත කී ස්ථානයේදී පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජධීර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් මහජනතාව සඳහා විවෘත කිරීමට සංවිධානය කර ඇත.

2013.01.11 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී එතුමන් මෙම සංකල්පය සම්බන්ධයෙන් ඔබට ලබා දුන් උපදෙස් පරිදි දැනටමත් කටයුතු කර ඇති බවට විශ්වාස කරමි.ඒ අනුව මෙම කලාපොළ තුළින් බන්ධනාගාර ගත රැඳවියන්ගේ නිර්මාණ කුසලතා ඔප් නංවාලීමට විශේෂ අවස්ථාවක් ලැබෙනවා පමණක් නොව සිරකරුවන් පුනරුත්ථාපනයට එය මහත් පිටුවහලක් වනු ඇත.ඊට අමතරව සිරකරුවන්ගේ සුභ සාධනයට මෙන්ම නිදහස් වන විටදි යම් කිසි ආර්ථික ශක්තියක් සහිතව නිදහස්ව යන්නට මෙකී වැඩපිළිවෙල බෙහෙවින්ම ඉවහල් වන්නකි. විවිධ නිර්මාණාත්මක දක්ෂතා සහිත සැකකරුවන් සම්බන්ධයෙන්ද අපගේ අධීක්ෂණය යටතේ මේ වැඩපිළිවෙලට යොදාගැනීමටද පිළිවෙන.

එබැවින් පහත සඳහන් උපදෙස් අනුව " **වෙලිකඩ කලාපොළ** "වැඩසටහන මාසිකව සාර්ථක කර ගැනීමට අවශ්‍ය අඛණ්ඩ වැඩසටහනක් සකස් කරන මෙන් දන්වමි.

01. ආරම්භක " **වෙලිකඩ කලාපොළ** " 2013.03.27 දින පැවැත්වෙන බැවින් ඔබ ආයතනයේ විවිධ කලා නිර්මාණ හැකියාවන් සහ දක්ෂතාවයන් සහිත සිරකරුවන් තෝරාගෙන (චිත්‍ර, මූර්ති, කැටයම්, නැටුම්, ගායනා වාදන, මැහුම් ගෙතුම්, සොකරි, කෝළම් සහ විවිධ ප්‍රාසාංගික අවස්ථා, සූපශාස්ත්‍ර, කර්මාන්ත, බේකරි නිෂ්පාදන, විවිධ අත්කම් සහ විවිධ වෘත්තිමය දක්ෂතාවයන් ඔස්සේ)

ඔවුන්ගේ නිර්මාණ සැකසීම කඩිනමින් ආරම්භ කරන්න. මෙම පොළෙහි විශේෂත්වය වන්නේ නේවාසිකයින්ට සජීවීව එම නිර්මාණ කිරීමට අවස්ථාව සලසා දීමයි.

02. මෙහිදි දැනටමත් ශිල්ප සහා පිහිටුවා ඇති පහත.සදහන් බන්ධනාගාරවලට මෙම කාර්යට වඩාත් සක්‍රිය සහභාගි විය හැක.

01.වැලිකඩ
02.බෝගම්බර
03මහර
04.කුරුවිට
05.වටරැක
06.පල්ලේකැලේ
07.වැලිකඩ කාන්තා
08.බෝගම්බර කාන්තා

03. මේ සදහා අවශ්‍ය වන වියදම් පියවා ගැනීමට අත්තිකාරම් මුදලක් ලෙසින් සිරකරු සුභ සාධක අරමුදලින් එක් ආයතනයකට රුපියල් 10,000.00 ක උපරිමයකට යටත්ව මුදල් ප්‍රතිපාදන සලසා දීමට කටයුතු කර ඇත.

04. ඔබ ආයතනය විසින් " බෙස්ලයින් කලාපොළ " සදහා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන දෑ සම්බන්ධයෙන් මූලික අධීක්ෂණයක් කිරීම සදහා මා විසින් බන්ධනාගාර අධිකාරි කමිටුවක් පත්කර ඇත. එම කමිටුව පෙබරවාරි මස 10 න් 15 න් අතර ඔබ ආයතනයට එකී අධීක්ෂණ කාර්ය සදහා පැමිණෙනු ඇත.

05. 2013 පෙබරවාරි 20 දින වන විට ඔබ ආයතනය විසින් කලා පොළ සදහා ඉදිරිපත් කිරීමට සූදානම් දෑ පිලිබඳව සම්පූර්ණ විස්තරයක් බන්ධනාගාර අධිකාරි (කර්මාන්ත) බන්ධනාගාර මූලස්ථානය වෙත එවීමට කටයුතු කල යුතු අතර (සහභාගී වන රැඳවියන්ගේ විස්තර සහිතව) 2013.03.26 දින වන විට සියළුම නිර්මාණ බෙස්ලයින් විදියේ (බන්ධනාගාර සංකීර්ණය ආශ්‍රිත) ස්ථානගත කිරීම සදහා විධිවිධාන යෙදිය යුතුය.

06. මෙම වැඩපිළිවෙලෙහි ඉදිරි වැඩ කටයුතු සම්බන්ධයෙන් යථාකාලයේදී ඔබට දැනගැනීමට අවශ්‍ය කටයුතු කරන අතර වැඩිදුර විස්තර බන්ධනාගාර අධිකාරි (ප.වි.පු.ම) හෝ බන්ධනාගාර අධිකාරි (කර්මාන්ත) වෙතින් හෝ බන්ධනාගාර අධිකාරි (සුභ සාධක) වෙතින් ලබා ගන්නා ලෙස දන්වමි.

නව සංකල්පයට අනුව දියත් කිරීමට අපේක්ෂිත " බෙස්ලයින් කලාපොළ " නිර්මාණාත්මක වැඩසටහන සාර්ථක කරගැනීමට ඔබගේ සම්පූර්ණ සහයෝගය අපේක්ෂා කරමි.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

පිටපත: ලේකම්,පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය (දැ.ගැ.පි)